# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2198/58 - 2020 ඔක්තෝබර් මස 23 වැනි සිකුරාදා - 2020.10.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට යෝජිත උඩුගම ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ තුළුමුව ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 15 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
යොමු අංකය : 5-2/GL/25

1A - G 32830 — 31 (2020/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

ගාල්ල දිස්ත්‍රික්කයේ, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 219C, උඩුගම උතුර ග්‍රාම නිලධාරි වසමේ, කැටගොඩ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු - උසාවි කොමසාරිස් එම්. එන්. ජේ. ඒ. පෙරේරා මහතා විසින් සකස් කරන ලද අංක : 367A දරන සැලැස්මේ කැබලි අංක : 4 ලෙස දැක්වෙන වක්කලම් ඔිවිට නැමති ප්‍රමාණයෙන් පර්චස් 33.12 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 03 (පැද්දෙන පාලම) සහ කැබලි අංක 05 ඉඩම ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 03 (පැද්දෙන පාලම) කැබලි අංක 05 සහ කැබලි අංක 06 (පාර) ; |
| *දකුණට* | : | කැබලි අංක 09 (පාර) සහ කැබලි අංක 05 ; |
| *බටහිරට* | : | කැබලි අංක 09 (පාර). |

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම සහ ලිපිනය : 1. පී. බී. විජේසුන්දර මහතා,
අලුත් ගෙදර,
කැටගොඩ,
උඩුගම.

11 - 148

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.